**දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල සංවර්ධන ව්‍යාපෘතිය - 2013**

---

දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය ( ශ්‍රීලංර ) සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව ( ජාසජබැ ) අතර 2006 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී/87 දරන ණය ගිවිසුමේ 4(8) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2008 ඔක්තෝබර් 01 සිට බලපැවැත්වෙන පරිදි ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව (ජාසජබැ) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) සමඟ සම්බන්ධ කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව , මහා මාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ , ඌන සංවර්ධිත නැගෙනහිර ප්‍රාදේශීය ආර්ථිකයේ, පදනම ප්‍රතිස්ථාපනය කිරීම සහ මඩකලපුවේ නව කල්ලඩි පාලම ඉදිකිරීම ඇතුළත්ව අක්කරෙයිපත්තු සහ තිරුක්කොන්ඩියමඩු අතර හානියට පත්වූ හා අර්ධවශයෙන් සුනාමි බලපෑමට ලක්වූ ජාතික මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම මඟින් ව්‍යාපෘති ප්‍රදේශය ඇතුළත හා බාහිරව ප්‍රවේශය වැඩිදියුණු කිරීමෙන් ප්‍රාදේශීය ආර්ථික අසමානතා අඩුකිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 4,460 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2010 සැප්තැම්බර් වන විට නිම කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාලය 2013 සැප්තැම්බර් 15 දක්වා දීර්ඝ කරන ලදි. කෙසේ වුවද ව්‍යාපෘති කටයුතු 2013 දෙසැම්බර් 31 දක්වා දිගටම පවත්වා ගෙන ගොස් තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන

කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම් ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3.** **මතය**

**--------**

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.500,395,458 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.7,510,101,696 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ජංගම - නොවන වත්කම් | 136,538 | - | 136,538 |
| කෙරීගෙන යන වැඩ | 445,695,635 | 6,150,036,481 | 6,595,732,116 |
| උපදේශක සේවා | 47,318,437 | 743,802,052 | 791,120,489 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකක වියදම | 7,244,848 | 115,867,705 | 123,112,553 |
| | 500,395,458 | 7,009,706,238 | 7,510,101,696 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතිය යටතේ එක් එක් මාර්ග පුනරුත්ථාපනය සඳහා දරන ලද මුළු පිරිවැය හඳුනා ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘතිය විසින් වෙනම පොත් කට්ටල හා වාර්තා පවත්වා නොතිබුණි.

(ආ) කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගය, මඩකලපුව තිරුක්කන්ඩියිමඩු-ත්‍රිකුණාමලය මාර්ගය සහ කල්ලඩි පාලම ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම නිම කර 2013 දෙසැම්බර් 15 දින ව්‍යාපෘතියට භාරදී තිබුණද, ඉහත ඉදිකිරීම් වැඩ සඳහා දරන ලද උපදේශක ගාස්තු හා ව්‍යාපෘති කළමනාකරණ ඒකක වියදමෙන් සමන්විත එකතුව රු.7,509,965,158 ක් වූ මුළු පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඇ) අනෙකුත් විදේශ අරමුදල් මූල්‍යයන ව්‍යාපෘති තුනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකක එකම කාර්යාල ගොඩනැඟිල්ලේ ස්ථානගතව ඇත. කෙසේ වුවද එම ව්‍යාපෘතිවලට අදාළ ජලය, විදුලිය, දුරකථන, ප්‍රවාහන ගාස්තු, ඉන්ධන වියදම් හා රක්ෂණ ගාස්තු සඳහා දරන ලද එකතුව රු.6,420,120 ක් වූ සියළු වියදම් වෙනම නිශ්චය කර නොගෙන හා එක් එක් ව්‍යාපෘතිවලට අයකිරීමෙන් තොරව මෙම ව්‍යාපෘතිය සඳහා අයකර තිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ලේඛනයෙන් කරන ලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජාසජබැ | 4,460 | 6,158 | - | - | 4,837 | 6,205,604 |
| ශ්‍රීලංර | - | 1,532 | 88,476 | 88,476 | - | 1,027,843 |
| එකතුව | 4,460 | 7,690 | 88,476 | 88,476 | 4,837 | *7,233,447 |

* පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන, රඳවාගැනීම් මුදල් හා උපචිත වියදම් ඉවත් කිරීම හේතුවෙන් මෙම මුදල මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදලින් වෙනස්වේ.

### 6.2 භෞතික කාර්යසාධනය

කල්ලඩි පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලංසුකරුවන්ගේ හැකියාව හා පූර්ව පළපුරුද්ද විධිමත්ව ඇගයීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පාලම ඉදිකිරීම සඳහා පළමු කොන්ත්‍රාත්කරුට පිරිනමන ලද රු.මිලියන 700 ක කොන්ත්‍රාත්තුව දුර්වල කාර්ය සාධනය හේතුවෙන් පසුව නවතා දමා තිබුණි. මුල් කොන්ත්‍රාත්තු වටිනාකමින් වැඩිවීම සියයට 95 ක් නියෝජනය වූ රු.මිලියන 1,389.5 ක පිරිවැයකට වෙනත් කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පළමු කොන්ත්‍රාත් ගිවිසුමට අනුව වූ රු.326,392,260 කට සමාන ජපන් යෙන් 228,600,000 ක් වූ උපදේශක ගාස්තු මුල් කොන්ත්‍රාත්තුවේ ඇතුළත් උපදේශක ගාස්තු වලින් සියයට 29 ක වැඩිවීමක් නියෝජනය වන රු.459,196,960 කට සමාන ජපන් යෙන් 321,318,914 ක් ලෙස සංශෝධනය කර තිබුණි.